## කො/දේවි බාලිකා විද්‍යාලය

## පළමු වාර පරීක්ෂණය - 2014


## ගණිතය

**7 ශ්‍රේණිය** | **කාලය පැය 1 විනාඩි 30**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


01. සෘජුකෝණාස්‍රයක ඇති සමමිති අක්ෂ ගණන කීයද ?

02. පහත රූපය ද්විපාර්ශ්වික සමමිතිය සහිත වනසේ සම්පූර්ණ කරන්න.



03. ද්විපාර්ශ්වික සමමිතිය සහිත ඉංග්‍රීසි කැපිටල් අකුරු 2 ක් ලියන්න.

04. A = {10 ට අඩු ඔත්තේ සංඛ්‍යා} නම් පහත වෙන් රූපය සම්පූර්ණ කරන්න.




05. 24 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න.

06. 9136 හි ඉලක්කම් දර්ශකය සොයන්න.

07. පහත සමූහ අතුරින් කුලක වන සමූහ තෝරා ඒවායේ අංක හිත් ඉර මත ලියන්න.

i. උස සිසුන්

ii. 25 km ට වැඩි දුරක සිට පාසලට පැමිණෙන සිසුන්

iii. දේදුන්නේ වර්ණ

iv. ජනප්‍රිය ක්‍රිකට් ක්‍රීඩකයන් ----------------------------

08. 32 , 2 හි බලයක් ලෙස ලියන්න.

09. හිස්තැන් පුරවන්න.
සංඛ්‍යාවක් ඉතිරි නැතිව 6 න් බෙදීමට නම්, එම සංඛ්‍යාව ඉතිරි නැතිව ................. න් හා ............. න් බෙදිය හැකි විය යුතුයි.

10. 1300, 826, 785, 1620 යන සංඛ්‍යා අතුරින් 4 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

11. 2300 වර්ෂය අධික අවුරුද්දක් වේද ? ඔබේ පිළිතුරට හේතුව ලියන්න.

The National e-learning Portal for The General Education

12. බලවල ගුණිතයක් ලෙස ලියන්න.

$3 \times 3 \times 2 \times 2 \times 2 \times P \times P$

13. $X = 2$ සහ $Y = 3$ නම්, $2X^2Y^2$ හි අගය සොයන්න.

14. හිස්තැන් පුරවන්න.

i) 13 g 750mg = ................................ mg

ii) 12527 g = ...................... kg ................ g

15. i. ක්‍රිස්තු වර්ෂ ආරම්භ වන්නේ කුමන සිද්ධියක් මුල්කර ගෙනද ?

ii. ක්‍රි.ව.1 900 න් අවසන් වන ශතවර්ෂය කුමක්ද ?

16. දර්ශක ආකාරයෙන් ලියන්න.

i. 3 x 3 x 3 x 3 x 3

ii. a x a x a

17. අමල්ගේ උපන් දිනය 2003.09.13 වේ.

2014.03.27 වන දිනට අමල්ගේ වයස සොයන්න.

18. වෙළඳපොළට රැගෙන ගිය 8kg 300g පළතුරු තොගයකින් විකිණීමට නොහැකිව 1 kg 400g ක් ඉතිරි විය. විකිණු පළතුරුවල ස්කන්ධය කොපමණද ?

19. කිරිබත් එකක් පිළියෙල කිරීමට එක් අයෙකුට කිරිපිටි 5g අවශ්‍ය නම්, 480 g කිරිපිටි පැකට්ටුවකින් කිරිබත් කොපමණ සෑදිය හැකිද ?

20. 5 ______ 83 සංඛ්‍යාව 3 න් බෙදේ නම්, හිස්තැනට ගැළපෙන ඉලක්කම් එකක් ලියන්න.

The National e-learning Portal for The General Education

(ලකුණු 2 X 20 = 40)

## 2 - කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01) a) 3276 යන සංඛ්‍යාව

1. 2 න් ඉතිරි නැතිව බෙදේ ද ?

2. 3 න් ඉතිරි නැතිව බෙදේද ?

3. 6 න් ඉතිරි නැතිව බෙදේද ?

4. 9 න් ඉතිරි නැතිව බෙදේද ?

5. 4 න් ඉතිරි නැතිව බෙදේද ?

6. 5 න් ඉතිරි නැතිව බෙදේද ?

7. 10 න් ඉතිරි නැතිව බෙදේද ?

(ලකුණු 10)

b) ඉහත (a) කොටසේ ඇති සංඛ්‍යාවේ අඩංගු ප්‍රථමක සංඛ්‍යා මොනවාද ?

(ලකුණු 02)

The National e-learning Portal for The General Education

(02) 1. කුලකයක් නිරූපණය කළ හැකි ආකාර 3 නම් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

(ලකුණු 3)

2. 1 ත් 15 ත් අතර ඇති ප්‍රථමක සංඛ්‍යා කුලකය A නම්, A කුලකය ඉහත ආකාර 3 න්ම නිරූපණය කරන්න.

(ලකුණු 6)

3. B = {MATTAKKULIYA යන වචනයේ අකුරු} මෙම කුලකය ලැයිස්තුගත කර දක්වන්න.

(ලකුණු 2)

(03) 1. 32 හි සියළුම සාධක ලියා දක්වන්න.

(ලකුණු 03)

2. 30 , 40 යන සංඛ්‍යාවල කු.පො.ගු. සොයන්න.

(ලකුණු 03)

3. 30, 50 යන සංඛ්‍යාවල ම.පො.සා. සොයන්න.

(ලකුණු 04)

4. සංයුත සංඛ්‍යා යනු මොනවාද ?

(ලකුණු 02)

The National e-Learning Portal for The General Education

04) 1. 18 වන සියවසේ ආරම්භක දිනය හා අවසාන දිනය වර්ෂය සමඟ ලියන්න.

(ලකුණු 02)

2. සුළු කරන්න.

a)

| | අවු | මාස | දින |
|---|---|---|---|
| | 07 | 08 | 25 |
| + | 03 | 04 | 20 |

(ලකුණු 3)

b)

| | අවු | මාස | දින |
|---|---|---|---|
| | 10 | 08 | 03 |
| - | 07 | 05 | 07 |

(ලකුණු 3)

c) බෙදන්න.

1kg 501g 50mg ÷ 3

(ලකුණු 4)

05) 1. 343 , 7 හි බලයක් ලෙස ලියන්න.

(ලකුණු 2)

2. 625 , බලයක් ලෙස ප්‍රකාශ කිරීමේදී දර්ශකය 4 වීමට පාදය කීයක් විය යුතුද ?

(ලකුණු 2)

3. 108 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න.

(ලකුණු 4)

4. $a = 2$ , $b = 3$ , $c = 4$ නම්

$4a^2bc$ හි අගය සොයන්න.

(ලකුණු 4)

The National e-learning Portal for The General Education